# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## විභාග දෙපාර්තමේන්තුව

## විභාග දෙපාර්තමේන්තුවේ වැඩමුළු සඳහා කේටරිං සේවාව සැපයීම සහ ආහාර පාන බෙදීම සඳහා වන ප්‍රසම්පාදනය

### (වර්ෂයක කාලය සඳහා - 2019.04.01 සිට 2020.03.31 දක්වා)

### කොන්ත්‍රාත් අංකය : 4/4/6/2019

1. විභාග කොමසාරිස් ජනරාල් වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් විභාග දෙපාර්තමේන්තුවේ වැඩමුළු සඳහා කේටරිං සේවාව සැපයීම සහ ආහාරපාන බෙදදීම සඳහා වන ප්‍රසම්පාදනය සඳහා (2019.04.01 සිට 2020.03.31 දක්වා වර්ෂයක කාලයක් සඳහා) යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් පහත සඳහන් අවම පළපුරුද්ද සහිත ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. සම්පූර්ණ විස්තර ලංසු ලිපිලේඛනයේ ඇතුළත් කොට ඇත.

2. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ආහාරපාන කේටර් කිරීම සම්බන්ධයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය.

4. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු විභාග දෙපාර්තමේන්තුවේ 03 වන මහලේ සැපයුම් අංශය වෙතින් (දුරකථන අංකය 0112786200 හෝ 011-2785219) ලබාගත හැකි අතර, 2019.02.26 වෙනි දින දක්වා පෙ.ව. 9.00 සහ ප.ව. 3.00 අතර ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

5. එක් ලිපි ලේඛන කට්ටලයක් සඳහා ආපසු ගෙවනු නොලබන රු. 2000/= ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2019.02.26 වෙනි දින ප.ව. 3.00 හෝ ඊට පෙර ලිඛිත අයදුම්පතක් සමග ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කිරීමෙන් සැපයුම් අංශය වෙතින් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. (ගෙවීම් මුදලින් සිදුකළ යුතුය.)

6. ලංසු විවෘත කරනු ලබන දිනයේ සිට දින 90 ක් (2019.05.28 වෙනි දින දක්වා) ලංසු වලංගු විය යුතුය.

7. සියලුම ලංසු සමග ලංසු බාරගැනීමේ අවසාන දිනයේ සිට දින 120 ක් (2019.06.27 වෙනි දින දක්වා) වලංගු ලංසු ලිපිලේඛනයේ අමුණා ඇති ආකෘතිය මත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පිළිගත් වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද කොන්දේසි රහිත බැංකු ඇපකරයක් ලෙස ශ්‍රී ලංකා රුපියල් පනස් දහසක් (ලංකා රු. 50,000/=) වටිනා ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය.

8. ලංසු, 2019.02.27 වෙනි දින ප.ව. 2.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි "සැපයුම් අංශය, 3 වන මහල, විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනය වෙත ගෙනැවිත් බාරදිය යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ පසුව ඉහත සඳහන් ලිපිනයේදී පුද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

9. නිසි ලෙස සම්පූර්ණ කරන ලද මුද්‍රා තබන ලද ලංසු, එය බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "විභාග දෙපාර්තමේන්තුවේ වැඩමුළු සඳහා කේටරිං සේවාව සැපයීම සහ ආහාරපාන බෙදදීම සඳහා වන ප්‍රසම්පාදනය– (2019.04.01 වෙනි දින සිට 2020.03.31 වෙනි දින දක්වා වසරක කාලයක් සඳහා) කොන්ත්‍රාත් අංකය : 4/4/6/2019" සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.

10. බලපෑමට ලක්වන ලංසුකරු හෝ ලංසුකරුවන්ට කිසිදු වගකීමකින් තොරව හෝ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ ක්‍රියාවලියට බලපෑමට ලක් වූ ලංසුකරුට හෝ ලංසුකරුවන්ට දැන්වීමේ වගකීමෙන් නිදහස් වී කොන්ත්‍රාත් ප්‍රදානයට පෙර ඕනෑම අවස්ථාවක ඕනෑම ලංසුවක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුයි.

**විභාග කොමසාරිස් ජනරාල්,**
**විභාග දෙපාර්තමේන්තුව,**
**පැලවත්ත, බත්තරමුල්ල.**

**2019.02.05**